මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2022/08/30

**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**Human Rights Commission of Sri Lanka**

වගඋත්තර පාර්ශවය : 01. ලුතිනන් කර්නල් ප්‍රති විරාජ් කුමාරසිංහ මහතා,
ජාතික ආරක්ෂක බලමුළුව,
ශ්‍රී ලංකා යුධ හමුදාව,

02. නීති අධ්‍යක්ෂ,
යුධ හමුදා මූලස්ථානය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

**පැමිණිලි අංකය : HRC/SUO/MOTU/14/22**

**පැමිණිල්ල :-**

දඹුල්ල පාර, යග්ගහපිටිය, සදර්න් අයි ඕ සී තෙල් පිරවුම් හලේ දී 2022.07.03 වන දින යුධ හමුදා නිලධාරියෙක් විසින් සිවිල් වැසියෙකුට පා පහරක් එල්ල කිරීම සම්බන්ධයෙන් විද්‍යුත් මාධ්‍ය සහ සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය වූ ප්‍රවෘත්තිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය යටතේ කොමිෂන් සභාව විසින් එහි මෙහෙයවීම මත පරීක්ෂණ කටයුතු සිදුකර ඇත.

ඒ අනුව 2022.07.03 වන දින සදර්න් අයි ඕ සී ඉන්දියන් තෙල් පිරවුම් හලට තෙල් ලැබීමෙන් පසුව එම තෙල් බෙදා හැරීම සිදුකර ඇති බවත්, එම තෙල් බෙදා හැරීමේ කටයුතු නිසි අයුරින් සිදුකිරීම සහ පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව සහ පොලිසිය විසින් කටයුතු කර ඇති බවත්, එම අවස්ථාවේදී යුධ හමුදා නිලධාරීන් දෙදෙනෙකු සිවිල් පුද්ගලයෙකුව අල්ලාගෙන යුධ හමුදා ඉහළ නිලධාරියෙක් වෙත ඉදිරිපත් කළ බවත්, එහිදී එම නිලධාරියා විසින් අදාළ සිවිල් පුද්ගලයාට පා පහරක් එල්ල කළ බවට අදාළ ප්‍රවෘත්ති වල සන්නිවේදනය වන ලදි.

මෙම සිද්ධිය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විසින් පනතේ 14 වන වගන්තිය ප්‍රකාරව සිය මෙහෙයවීමෙන් පරීක්ෂණයක් ආරම්භ කරන ලද අතර, ඒ සඳහා 2022.08.01 වන දින ඉහත නම් සඳහන් පළවන වගඋත්තරකරු සහ යුධ හමුදා නීති අධ්‍යක්ෂ කොමිෂන් සභාව වෙත කැඳවා ප්‍රකාශ ලබාගැනීමට කටයුතු කරන ලදි.


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் | 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04.
සභාපති / தவிசாளர் / Chairperson | 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax | 011 2505541/74
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail | sechrcsl@gmail.com

ඒ අනුව අදාළ පරීක්ෂණය සඳහා පළවන වගඋත්තරකරුවන් වශයෙන් ලුතිනන් කර්නල් කේ.ඒ.ඩී.අසිත ප්‍රති විරාජ් කුමාරසිංහ මහතා සහ යුධ හමුදා නීති අධ්‍යක්ෂක වෙනුවෙන්, බී.එස්.කන්නන්ගර මහත්මිය සහභාගී වී ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීම :-

පළවන වගඋත්තරකරු ශ්‍රී ලංකා යුධ හමුදාවේ ජාතික ආරක්ෂක බලමුළුවේ ලුතිනන් කර්නල්වරයෙකු වශයෙන්ද, වාරියපොල යුධ හමුදා කඳවුරේ පළවෙනි ශ්‍රී ලංකා ආරක්ෂක බලමුළුවේ අණදෙන නිලධාරියා ලෙස ද කටයුතු කරන බවත්, කොවිඩ් වසංගත තත්ත්වය පැවති සමයේ වයඹ පළාත් සෞඛ්‍ය අධ්‍යක්ෂවරයාගේ මඟපෙන්වීම මත කොරෝනා උවදුර නැති කිරීම සඳහා ක්‍රියාත්මක වූ වැඩපිළිවෙලට තමා සක්‍රිය ලෙස දායක වූ නිලධාරියෙක් බව ද ප්‍රකාශ කර ඇත.

රට තුළ ඇති වූ ඉන්ධන අර්බුදකාරී තත්ත්වය සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් ඉන්ධන හල් වෙත ලබාදී තිබූ ආරක්ෂාව සහ අනෙක් පරිපාලන කටයුතු සිදුකිරීමේදී පොලිසිය වෙත ඇති වූ යම් යම් ගැටළුකාරී තත්ත්වයන් හේතු කොට ගෙන ආරක්ෂක හමුදා වෙත පොලිසියට සහය වීම සඳහා සහ අදාළ කාර්යයන් ඉදිරියට පවත්වාගෙන යාම සඳහා බලය පවරා තිබූ බව ද සඳහන් කර ඇත.

ඒ අනුව වර්ග කිලෝමීටර් 4816 ක් වූ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිපෙට්කෝ ඉන්ධන හල් 102 ක් සහ අයි ඕ සී ඉන්ධන පිරවුම් හල් 13 ක් සඳහා ආරක්ෂාව ලබාදීම සඳහා ද සහ අනෙකුත් පරිපාලන කටයුතු සඳහා රාජකාරි පවරා තිබූ බව සඳහන් කර ඇත. ඒ අනුව පළවන වගඋත්තරකරු කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ඉන්ධන බෙදා හැරීමේ මධ්‍යස්ථාන වල අධීක්ෂණ කටයුතු සිදුකරන ලද බවත්, ඊට අමතරව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සහ ඔවුන්ගේ නිවාස වල ආරක්ෂාව සඳහා කටයුතු කරන ලද බවත් සඳහන් කර ඇත.

ඉන්ධන බෙදා හැරීමේ කාර්යය කරගෙන යාමේදී රට තුළ නොයෙකුත් පුද්ගලයන් වංචා සහගත ලෙස ඉන්ධන ජාවාරම් කරගෙන යාම, ඉන්ධන හල් වෙත පහරදීම, මනුෂ්‍ය ඝාතන සිදුකිරීම වැනි සිදුවීම් සිදුව තිබූ බවත්, පළවන වගඋත්තරකරු වෙත භාරදී තිබූ දිස්ත්‍රික්කයේ වෙසෙන ජනතාව සඳහා බියෙන් සැකයෙන් තොරව ඉන්ධන ලබාදීම සඳහා කටයුතු කළ බවත් ප්‍රකාශ කර ඇත.

ඒ අනුව 2022 ජූලි මස 27 දින හෝ ආසන්න දිනකදී කුරුණෑගල නගරයේ සිට දඹුල්ල මාර්ගයේ තුන්වන කිලෝමීටරයෙහි කොස් කැලෑව නම් කැලෑබද ප්‍රදේශයේ පිහිටි ලාෆ් සමාගම විසින් පවත්වාගෙන ගිය යග්ගහපිටිය නම් ඉන්ධන පිරවුම් හල වෙත ශ්‍රී ලංකා යුධ හමුදාව සහ පොලිසිය විසින් ප්‍රමාණවත් ආරක්ෂාවක් නොදෙන බවට සඳහන් කරමින් රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත යොමු කර තිබූ ලිපියේ පිටපතක් පළවන වගඋත්තරකරු වෙත යොමු කර තිබූ බවත්, ඒ අනුව මෙම ඉන්ධන පිරවුම් හලට ආරක්ෂාව ලබාදීම සබැඳිව මූලස්ථානය සමඟ සාකච්ඡා කොට විශේෂ ආරක්ෂක වැඩ පිළිවෙලක් සකස් කරන ලද බව ප්‍රකාශ කර ඇත.

එනම්, සාමාන්‍ය ඉන්ධන පිරවුම් හලකට නිලධාරීන් 07 දෙනෙක් යොදවන ලද අතර, මෙම පිරවුම් හලට නිලධාරීන් 28 දෙනෙකු යෙදවූ බවත්, එසේ යොදවා 2022.07.03 වන දින නැවත ඉන්ධන බෙදීමට කටයුතු කළ බව සඳහන් කර ඇත. එසේම, මීට පෙර මෙම ස්ථානයේ රාජකාරි සිදුකරන ලද පොලිස් නිලධාරීන් හට ගල් ප්‍රහාර එල්ල කර කුරුණෑගල ප්‍රධාන මාර්ගය වසා තිබූ බව ද සඳහන් කරයි. මෙම තත්ත්වය මත ඉන්ධන පිරවුම් හලේ ආරක්ෂක කටයුතු සම්බන්ධව සොයා බැලීම සඳහා එදින පැය 12.30 ට පමණ එම ස්ථානයට ගොස් අවට සිටි ජනයා සමඟ කථාබහ කර කාර්යාලය තුළට වී නිරීක්ෂණ කටයුතු සිදු කරන ලද බව ද, ඉන්ධන බෙදා දී අවසන් වීමත් සමඟම කුඩා කණ්ඩායමක් ඉන්ධන බෙදා දීමේ පිළිවෙතට බැහැරව ඉන්ධන හල සීමාව තුළට ඒමට උත්සාහ කරන ලද බවත්, එම නිසා ඒ සම්බන්ධයෙන් ඉතා සැලකිල්ලෙන් සිටි බවත්, එක්වරම තම සෙබළුන් සමඟ කළහකාරි තත්ත්වයක් ඇති කර ගනිමින් සිටි අයුරු දැක ගැනීමට ලැබුණු බවත්, ඒ අතරතුරදී හෙල්මට් පැළඳගත් පුද්ගලයින් දෙදෙනෙකු තම නිලධාරීන් විසින් ඉන්ධන හල දෙසට රැගෙන එන අයුරු දැකගන්නට ලැබුනු බවත්, පළවන වගඋත්තරකරු ද එදෙසට ගමන් කරමින් සිටිනවිට තවත් පිරිසක් කෑ ගසමින් ඉන්ධන හලට පැමිණෙනු දක්නට ලැබුනු බවත් සඳහන් කර ඇත. තමා ඒ අවස්ථාවේදී ඉන්ධන හල දෙසට රැගෙන එමින් සිටි අයවළුන් දෙසට පා පහරක් එල්ල කර අහිංසක මිනිස්සුන්ට ඉන්ධන ලබාදීමට ඉඩ ලබාදෙන ලෙසට කෑ ගසා ඉන්ධන හල දෙසට පැමිණි පිරිස් පළවා හැරීමට කටයුතු කළ බවත්, නිලධාරීන් දෙදෙනා රැගෙන ආ තරුණයන් දෙදෙනාව දොරටියාව පොලිස් ස්ථානයට භාරදීමෙන් පසුව ඔවුන්ගේ ඥාතීන් පොලිසිය වෙත පැමිණ මින් ඉදිරියට රාජකාරි කටයුතු වලට මෙලෙස බාධා නොකරන බවට පොලිස් ස්ථානාධිපතිවරයා ඉදිරියේ දී පොරොන්දු වීමෙන් පසුව තමා විසින් කළ රාජකාරියේ බැරෑරුම් තත්ත්වය අදාළ තරුණයන්ට සහ ඔවුන්ගේ දෙමාපියන්ට අවබෝධ කර දී සමථයට පත්වන ලද බවත් සඳහන් කර ඇත.

කොමිෂන් සභාව විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් ප්‍රචාරය වූ වීඩියෝ දර්ශන වගඋත්තරකරුවන් වෙත පෙන්වූ අතර, එම වීඩියෝ දර්ශනයේ පළවන වගඋත්තරකරු සිටින බවට ඔහු විසින් කොමිෂන් සභාව ඉදිරියේ පිළිගෙන ඇත.

ඒ අනුව පළවන වගඋත්තරකරු ඒ සම්බන්ධයෙන් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත්තේ, අදාළ පුද්ගලයින් තමා කිසිවිටෙක දැක නැති සහ හැඳුනුම්කමක් හෝ නැති පුද්ගලයින් දෙදෙනෙකු බවත්, ඔවුන් වෙත එල්ල කරන ලද පහර ද්වේෂ සහගත ලෙස සිදුකරන ලද පහරක් නොවන බවත්, සීසී ටීවී කැමරා තුළින් මේ බව නිරීක්ෂණය වන බවත්, තමාට එම පුද්ගලයන් හට පහරදීමේ අධිෂ්ඨානයක් තිබුනේ නම්, නොකඩවා පහරදෙමින් හෝ මිනිස්සුන්ට නොපෙනෙන තැනකට ගෙන ගොස් පහරදීමේ හැකියාව තිබූ බවත්, ප්‍රදේශය තුළ පාතාල කණ්ඩායම් සහ පිරවුම් හල දෙසට පැමිණෙන පිරිස් වැළැක්වීම සඳහා බිය ගැන්වීමට එසේ සිදුකළ බවත් ප්‍රකාශ කර ඇත.

**නිරීක්ෂණ :-**

රට තුළ ඉන්ධන අර්බුදයක් තිබූ බවත්, එම තත්ත්වය මත ඉන්ධන හල් ආශ්‍රිතව කළහකාරි තත්ත්වයන් ඇති වූ අතර, එම අර්බුදකාරි තත්ත්වයන් මඟහරවා ගැනීමට ඉන්ධන බෙදා හැරීමේ කටයුතු සඳහා ශ්‍රී ලංකාව පුරා ත්‍රිවිධ හමුදාව යෙදවීමට කටයුතු කර තිබූ බව නිරීක්ෂණය වේ.

මෙම සිද්ධියට අදාළ යග්ගහපිටිය ඉන්ධන පිරවුම් හලට යුධ හමුදා නිලධාරීන් 28 දෙනෙක් අදාළ ආරක්ෂක කටයුතු සඳහා යෙදවූ බව පළවන වගඋත්තරකරු ප්‍රකාශ කර ඇති අතර, ලබාදී ඇති සීසී ටීවී දර්ශන සහිත සීඩී අංක 01 තැටිය පරීක්ෂා කිරීමේදී යුධ හමුදා නිලධාරීන් එවැනි ප්‍රමාණයක් රාජකාරියේ යෙදී සිටි බවට නිරීක්ෂණය වේ.

යුධ හමුදා නිලධාරීන්ට අමතරව පොලිස් නිලධාරීන් ද විශාල පිරිසක් එම ස්ථානයේ රාජකාරි කටයුතු සිදුකර ඇති බව නිරීක්ෂණය වේ.

සීසී ටීවී කැමරා දර්ශන නිරීක්ෂණය කිරීමේදී ඉන්ධන පිරවුම් හල් භූමිය හා ඒ අවට යම් කළහකාරි හැසිරීමක් සිදුව ඇති බවට නිරීක්ෂණය වේ.

ඉන්ධන පිරවුම් හල් භූමියේ තිබූ සීසී ටීවී කැමරා වල පටිගත වී තිබූ දර්ශන සංයුක්ත තැටියකට පටිගත කිරීම සිදුකර ඇති අතර, එම සංයුක්ත තැටිය අංක 01 ලෙස නම් කර ඇති අතර, එය නැරඹීමේදී ඉන්ධන හල් භූමිය තුළ යම් කළහකාරි තත්ත්වයක් දර්ශනය වන අතර, ඒ අවස්ථාවේදී හෙල්මට් එකක් පැළඳි සිවිල් වැසියෙක්ව යුධ හමුදා නිලධාරීන් විසින් ඔවුන් භාරයට ගැනීමෙන් පසුව ඔහුට යම් පහරදීමක් සිදු කරන බවට ද, පසුව යුධ හමුදා නිලධාරීන් දෙදෙනෙක් විසින් ඔහුව රැගෙන එන දර්ශනය ද මෙම සීඩී පටයේ දර්ශනය වන බවටද නිරීක්ෂණය වේ.

එසේම, එම පුද්ගලයාව උසස් නිලධාරියෙක් වෙත රැගෙන එන අතර, ඒ අවස්ථාවේදී එම නිලධාරියා විසින් ද මෙම සිවිල් වැසියාට පා පහරක් එල්ල කරන බවට නිරීක්ෂණය වේ.

ඊට අමතරව එම පා පහර සිදුකිරීමෙන් පසුව එම ස්ථානයේ සිටින තවත් යුධ හමුදා නිලධාරියෙක් මෙම සිවිල් පුද්ගලයාගේ මුහුණ දෙසට පහරක් එල්ල කරන බවට නිරීක්ෂණය වේ.

දොරටියාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා කොමිෂන් සභාව වෙත එවා ඇති වාර්තාව අනුව දෙපාර්ශවය විසින් පොලිස් ස්ථානයේදී සමථයකට පත් වී ඇති බවට නිරීක්ෂණය වේ.

සිද්ධියට භාජනය වී ඇත්තේ ඒ.එන්.ප්‍රදීප් අත්තනායක නැමති පුද්ගලයෙකු වන අතර, ඔහුගේ දුරකථන අංකය 0760529881 වන අතර, කොමිෂන් සභාව විසින් 2022.08.10 වන දින අවස්ථා කිහිපයකදීම එම දුරකථන අංකයට ඇමතූ නමුත් ඇමතුම ලබාගන්නා පුද්ගලයා විසින් එවැනි පුද්ගලයෙක් නොදන්නා බවට ප්‍රකාශ කර ඇති බව නිරීක්ෂණය වේ.

තවද, සිද්ධියට භාජනය වූ පුද්ගලයා කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් කර නොමැති බව ද නිරීක්ෂණය වන අතර, දොරටියාව පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයාගේ වාර්තාවට අනුව ප්‍රදීප් අත්තනායක යන අයට මේ සම්බන්ධයෙන් ඉදිරි නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය නොවන බවට ප්‍රකාශ කර ඇති බව ද නිරීක්ෂණය වේ.

නිගමනය :-

රට තුළ පවතින ඉන්ධන හල් භූමි වල පැවති අර්බුදකාරී තත්ත්වය මත සිද්ධියට අදාළ යග්ගහපිටිය ඉන්ධන පිරවුම් හල් භූමිය තුළ කළහකාරී තත්ත්වයක් දක්නට ලැබුණු අතර, වෙනත් පිරවුම් හලකට ලබා නොදී තිබූ ආරක්ෂාවක් මෙම ඉන්ධන පිරවුම් හල වෙත ලබාදීමට යුධ හමුදාව කටයුතු කර ඇත. ඒ අනුව මෙවැනි තත්ත්වයක් තුළ සීසී ටීවී කැමරා දර්ශන වලට අනුව යම් යම් පිරිස් කළහකාරී ලෙස හැසිරෙන අයුරු පෙනියයි.

කෙසේ වෙතත් එවැනි තත්ත්වයක් පැවතියදී වුවද, අදාළ සීසී ටීවී දර්ශන වල පෙන්නුම් කරන ආකාරයට යුධ හමුදා නිලධාරීන් විසින් සිවිල් පුද්ගලයෙකු ඔවුන් භාරයට ගැනීමක් සිදුකරන අතර, ඒ අවස්ථාවේදී ද එම පුද්ගලයාට පහරදීමක් සිදුවන අතර, ඉන්පසුව ඔහුව පළවන වගඋත්තරකාර ලූතිනන් කර්නල් කේ.ඒ.ඩී.අසිත ප්‍රති විරාජ් කුමාරසිංහ යන අය ඉදිරිපිටට රැගෙන ආ අවස්ථාවේදී එම නිලධාරියා විසින් ද අදාළ සිවිල් පුද්ගලයා වෙත පා පහරක් එල්ල කරනු ලබයි.

එසේම, ඉන්පසුවද එම ස්ථානයේ සිටි තවත් යුධ හමුදා නිලධාරියෙක් මෙම ඒ.එන්.ප්‍රදීප් අත්තනායක නමැති පුද්ගලයාගේ මුහුණ දෙසට පහරදීමක් සිදුකරන අතර, මෙම දර්ශන තුළින් ඒ.එන්.ප්‍රදීප් අත්තනායක යන අයට පළවන වගඋත්තරකරු ඇතුළු එහි සිටින යුධ හමුදා නිලධාරීන් විසින් පහරදීමක් සිදුකර ඇත.

තවද, කොමිෂන් සභාව ඉදිරියේදී පළවන වගඋත්තරකරු වෙත අදාළ වීඩියෝ දර්ශන ඉදිරිපත් කළ අවස්ථාවේදී අදාළ සිවිල් පුද්ගලයාට එම පා පහර තමා විසින් එල්ල කරන ලද බවට පළවන වගඋත්තරකරු විසින් පිළිගෙන ඇත.

පළවන වගඋත්තරකරු පළපුරුදු සහ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙක් බවත්, මීට පෙර කොවිඩ් වසංගතය කාලය තුළ ද එය පාලනය කිරීම සම්බන්ධයෙන් සිදුකරනු ලැබූ කටයුතු වලට සහභාගී වූ බවත් ඔහුගේ ප්‍රකාශය තුළින්ම දක්වා ඇති අතර, එවැනි පළපුරුදු නිලධාරියෙකු සිවිල් පුද්ගලයන් සමඟ කටයුතු කිරීමේදී මීට වඩා සංයමයකින් හා විනයානුකූලව කටයුතු කළ යුතු බවට කොමිෂන් සභාව නිරීක්ෂණය කරන අතර, සමස්ත සිද්ධිය තුළ පළවන වගඋත්තරකරු සහ මීට සම්බන්ධ වූ අනෙකුත් නිලධාරීන්ගේ හැසිරීම මානව හිමිකම් සභාවට අනුමත කළ නොහැක. එසේම, ත්‍රිවිධ හමුදාව සිවිල් මහජනතාව සමඟ කටයුතු කිරීමේදී මීට වඩා සංයමයකින් සහ ඉවසිලිවන්තව කටයුතු කළ යුතු අතර, ඉදිරියේදී මෙවැනි අවස්ථාවන් ඇති නොවිය යුතුය.

ඒ.එන්.ප්‍රදීප් අත්තනායක යන අය එම ස්ථානයේ කළහකාරී ලෙස හැසිරුනේ නම්, ඔහු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට පොලිසියට පැවරීමට කටයුතු කළ යුතුව තිබූ අතර, එසේ නොකර ඒ.එන්.ප්‍රදීප් අත්තනායක යන සිවිල් පුරවැසියාට පළවන වගඋත්තරකරු ඇතුළු අනෙක් හමුදා නිලධාරීන් කිහිප දෙනෙකු විසින් පහරදීම තුළින් එකී වින්දිත තැනැත්තා වන ඒ.එන්.ප්‍රදීප් අත්තනායක යන සිවිල් පුරවැසියාගේ 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යවස්ථාව මඟින් සහතික කර ඇති කෲර අමානුෂික සහ අවමන්

සහගත සැළකිල්ලකට භාජනය නොවීමේ අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය :-**

ඒ අනුව 1949 අංක 17 දරණ ශ්‍රී ලංකා යුධ හමුදා පනත ප්‍රකාරව පළවන වගඋත්තරකාර නිලධාරියා ඇතුළු පහරදීමට අදාළ අනෙක් නිලධාරින් විසින් සංක්‍රමික විනයට හානිකර ක්‍රියාවක් සහ හැසිරීමක් සිදුකර ඇති බවට පෙනියන බැවින් ද, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වන ව්‍යස්ථාව උල්ලංඝනය කර ඇති බැවින් ද, පළවන වගඋත්තරකරු ඇතුළු පහරදුන් අනෙක් නිලධාරින් හඳුනාගැනීමට කටයුතු කර එම නිලධාරින්ට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසට යුධ හමුදාපතිවරයාට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2022. 09. 16 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාව වෙත ලැබීමට සලස්වන ලෙසට 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පනතේ15 (7) වගන්තිය ප්‍රකාරව පොලිස්පති වෙත මෙයින් දන්වා සිටිමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලි පාර්ශවය විසින් ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාව වෙත දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම් සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වා සිටිමු.

රෝහිණී මාරසිංහ,
(විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු)
සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

විජිත නානායක්කාර,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. Vijitha Nanayakkara
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත : 01. අමාත්‍යතුමා,
ආරක්ෂක අමාත්‍යාංශය,
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.

02. යුධ හමුදාපති,
යුධ හමුදා මූලස්ථානය,
කොළඹ.

B/CA